# ශ්‍රී ලංකාවේ පළාත් පාලන අධිකාරීන් සහ ඉඩම් පිළිබඳ

# අත්පොත




**නීතිය හා සමාජ භාරය**

ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ වැඩ සටහන

# ශ්‍රී ලංකාවේ පළාත් පාලන අධිකාරීන් සහ ඉඩම් පිළිබඳ

# අත්පොත

**නීතිය හා සමාජ භාරය**

**නො. 03, කින්සි ටෙරසය,**

**කොළඹ 08**

**ඇගයීම්:**

නීතිය හා සමාජ භාරයේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ වැඩසටහනේ පරිශ්‍රමය සාර්ථක කිරීම පිණිස නෛතික පර්යේෂණ කටයුතු වලින් සහ කතෘත්වය සඳහා දායක වූ නීතිඥ දිනුශිකා දිසානායක මහත්මියටද, බිනේන්ද්‍රි පෙරේරා මෙනෙවියටද, විශ්ලේෂණය සඳහා සහාය වූ දිල්හාරා පතිරණ මෙනෙවියටද, නීතිඥ ශෙවොන් ගුණවර්ධන මහතාටද අතිශයින් ස්තුතිවන්ත වෙමු.

© මෙම ලේඛනයේ අන්තර්ගතය හෝ එහි කොටස් වාණිජ නොවන පරමාර්ථයන් සඳහා පමණක් උපුටා ගැනීම හා පිටපත් කිරීමට ලේඛනය හා එහි ප්‍රකාශක නියමාකාරයෙන් හඳුන්වා දීමෙන් අනතුරුව සිදු කිරීමට අවසර දී ඇත.

**පිටකවරයේ ඡායාරූපය:**

Caricature of Charles Bradlaugh. Scanned from Punch, 10 September 1881, page 118. Artwork by en:Edward Linley Sambourne|Source=Originally from [http://en.wikipedia.org en.wikipedia]

**ප්‍රකාශකය:**

නීතිය හා සමාජ භාරය,
3, කින්සි ටෙරසය,
කොළඹ 00800,
ශ්‍රී ලංකාව.
දුරකථන : +94 (0) 11 268 48 45
ෆැක්ස් : +94 (0) 112686843
වෙබ් අඩවිය : www.lawandsocietytrust.org

<u>**පටුන**</u>

1. හැඳින්වීම: මධ්‍යම සහ පළාත්
2. නාගරික සංවර්ධන අධිකාරිය
3. **පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීමේ දී පළාත්පාලන අධිකාරීන් අනුගමය කළයුතු පියවර මොනවාද?**

i. <u>**ප්‍රාදේශීය සභා** (PS)</u>

**අ. ප්‍රාදේශීය සභාවට ඉඩමක් මැනීම සිදුකළ හැකිද?**

ආ. ප්‍රාදේශීය සභාවට පෞද්ගලික ඉඩමක් අත්පත් කර ගත හැකිද?

ඇ. ප්‍රාදේශීය සභා පාරවල් සහ මාවත් ලෙස මාර්ග ප්‍රාදේශීය සභා සතුවී ඇත්තේ කෙසේද?

ඈ. පාරවල් වෙනත් අතකට හැරවීම් සහ පුළුල් කිරීම සඳහා ප්‍රාදේශීය සභා විසින් ඉඩම් අත්පත් කර ගන්නේ කෙසේද? (28 වගන්තිය)

**ඉ. පවත්නා වන්දි ලබාගැනීම් ක්‍රම මොනවාද?**

**ඊ. ඉහතකී 1 සහ 2ට අනුව වන්දිමුදල් හිමිකරගන්නා පුද්ගලයින්ගේ අයිතිවාසිකම් මොනවාද?**

**උ. සිදුවන්නේ කුමක්ද කුමන අවස්ථාවේ ද?**

ඌ. ඉදිකිරීමේ කාර්යයන් සඳහා නව මාවත් සම්බන්ධ කිරීම පිණිස ඉඩම් ලබාගැනීමේදී ප්‍රාදේශීය සභා සතුව ඇති බලතල මොනවාද?

එ. ප්‍රාදේශීය සභා පාලනය යටතේ පවතින මාවත්වල වැවෙන හෝ උඩින් එල්ලා වැටෙන ගස්, පඳුරු/ගොමු, පත්‍ර/අතු සහ ශාඛාවල මුල් ආදියට අදාළව ප්‍රාදේශීය සභාව සතු බලතල මොනවාද?

ඒ. වැටවල් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව සතු බලතල මොනවාද`?

ඔ. ස්වකීය බලාධිකාරිය යටතේ මාවත් දිගේ ඇති කාණු, පීලි,අගල් සහ දියපාරවල් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව සතු බලතල මොනවාද?

ii. <u>මහ නගර සභා සහ නගර සභා</u>

අ. මහනගර සභා සහ නගර සභා සතු සමාන බලතල මොනවාද?

ආ. ප්‍රාදේශීය සභා මත පැවරී ඇති බලය ඉක්මවා යන, මහනගර සභා සහ නගර සභා සතු බලතල මොනවාද ?

ව්‍යවස්ථාවන්

**1987 අංක 42 දරන පලාත්සභා පනත**

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය**

**1978 ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහා සංශෝධනය**

**1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

**1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය නැවත ලබාගැනීමේ) පනත**

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත**

1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනත

සංශෝධිත පරිදි 1939 අංක 61 දරන නගරසභා ආඥාපනත

සංශෝධිත පරිදි 1947 අංක 29 දරන මහනගර සභා ආඥාපනත

*ඉඩම් වල රජයේ අයිතිය*

*13 වන සංශෝධනය යටතේ පළාත්වල ඉඩම්වල අයිතිය පළාත් සභාවන්ට පැවරී ඇත;*

*කෙසේවෙතත්, රජයේ ඉඩම් අන්සතු කළ හැක්කේ ජනාධිපතිවරයාට පමණි;*

*මධ්‍යම රජය විසින් රජයේ ඉඩම් සම්බන්ධ එහි බලතල පළාත් සභා වෙතට ලබා දී නොමැති බව අධිකරණයන් විසින් තීරණය කර ඇත. -පළාත් සභාවන්හි බලතල පවතින්නේ යම් යම් සීමිත අවස්ථාවන්හි දී පමණි.*

## 1. හැඳින්වීම: මධ්‍යම සහ පළාත්

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව, ඉඩමක් පිළිබඳ හෝ ඉඩමක් මත අයිතිය, ඉඩම් බුක්තිය (ඉඩම් බුක්තිය යනු ඉඩමට ප්‍රවේශ වීම හෝ ඉඩම භාවිතයට පුද්ගලයින්ට හිමිකම ඇති ආකාරයයි), පවරාදීම සහ අන්සතුකිරීම (දේපළ අයිතිවාසිකම්වල හිමිකාරිත්වය පවරාදීම), ඉඩම් භාවිතය, ඉඩම් නිරවුල් කිරීම සහ ඉඩම් වැඩිදියුණුකිරීම ආදී සියල්ලම පළාත් සභාවලට පැවරී ඇත. (පළාත්සභා ලැයිස්තුවෙහි 18වන අයිතමය)

රජයේ ඉඩම් මධ්‍යම රජයට අයත් වේ. රජයේ ඉඩම් අන්සතු කළ හැක්කේ ජනාධිපතිවරයාගේ මුද්‍රාව යටතේ පමණි. (13වන සංශෝධනය, 11 වන පරිශිෂ්ටය). රජයේ ඉඩම් පළාත්බද මහාධිකරණයන්හි විෂය පථයෙන් බැහැරව පවතින බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ද පිළිගෙන ඇත. සීමිත අවස්ථාවන්හි දී හැර, එනම්, පළාත්සභා ලැයිස්තුවෙහි දී ඇති බලතල; මධ්‍යම රජය විසින් රජයේ ඉඩම් සම්බන්ධ ව ඇති එහි බලතල පළාත්සභාවලට ලබා දී නොමැති බව අධිකරණ විසින් පිළිගෙන ඇත. (ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචනා අංක. 21/2013)

## 2. නාගරික සංවර්ධන අධිකාරිය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරය ස්ථාපිත කර ඇත. මෙම නීතිය යටතේ, නාගරික සංවර්ධන අධිකාරියට නිශ්චල දේපල අත්පත්කර ගැනීමට හැකියාව ඇත. පළාත් පාලන අධිකාරියකට පැවරී ඇති කිසියම් ඉඩමක් නාගරික සංවර්ධන අධිකාරියට අවශ්‍ය කරන බවට 15 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන්නේ නම්, ගැසට් නිවේදනයෙහි පළකරනු ලබන දැන්වීමක් මඟින් එවන් ඉඩමක් නාගරික සංවර්ධන අධිකාරියට පැවරීමට අමාත්‍යවරයාට බලතල ඇත. තවද, ඉඩම සංවර්ධන ප්‍රදේශයක් ලෙස නම්කර තිබේ නම්, එවැනි ඉඩමක්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ පොදු කාර්යයක් සඳහා අත්පත්කර ගැනීමට රජයට හැකිය (පෞද්ගලික ඉඩම්).

1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති පනත (විශේෂ විධිවිධාන) විශේෂ ව්‍යාපෘතීන් සඳහා ඉතා ඉක්මණින් අවශ්‍ය කරනු ලබන ඉඩමක් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අත්පත් කර ගත හැක. හදිසි නාගරික සංවර්ධන කාර්යයක් සඳහා ඉතා ඉක්මණින් ඉඩමක් අවශ්‍ය කරනු ලබන බව සහ ඒ අනුව එය අත්පත් කර ගන්නා බවට ප්‍රකාශ කරමින් ගැසට් නිවේදනයක් හරහා නියෝගයක් නිකුත් කිරීමට විධායක ජනාධිපතිවරයාට බලතල ඇත. එවන් නියෝගයක් නිකුත් කළ පසු, රජයට (හෝ මේ

අවස්ථාව සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියට) 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනතෙහි 7 වන වගන්තිය යටතේ එකී ඉඩමෙහි සන්තකය ලබා ගත හැක. කෙසේවෙතත්, මෙවන් අවස්ථාවක දී පවා, පීඩාවට පත් ඉඩම් හිමියාට එවැනි අත්පත් කර ගැනීමක පොදු කාර්යය සම්බන්ධයෙන් අධිකරණයක දී අභියෝගයට ලක් කළ හැක. පෞද්ගලික ඉඩම් අත්පත් කරගත හැක්කේ පොදුකාර්යයක් සඳහා පමණි යන ඉඩම් අත්පත්කර ගැනීමේ පනතෙහි විධිවිධාන නාගරික සංවර්ධන අධිකාරියට නොසලකා හැරිය නොහැක.

- පොදු කාර්යයක් යනු කුමක්දැ යි ශ්‍රී ලංකාවෙ අධිකරණ වලින් අර්ථ දක්වා ඇත.
  - <u>පොදුකාර්යයක් නොවන්නේ කුමක් ද?</u>:-
    - *"හෙළිදරව් නොකළ කාර්යයක්"*[1] *(ජාතික ආරක්ෂාව සහ ඒ හා සමාන හේතූන් සඳහා ව්‍යතිරේකයන්ට ඉඩ ලබාදේ*[2]*)*
    - *"පෞද්ගලික කාර්යය හෝ කාර්යයක් කිසිසේත්ම නොමැති"*[3]
    - *"පෞද්ගලික ප්‍රතිලාභ හෝ පෞද්ගලික පළිගැනීම්"*[4]
    - *සඳහන් කළ කාර්යය සමඟින් නොගැළපෙන සැඟවුණු සමාන්තර කාර්යයන්*[5]
    - *තනි පුද්ගලයෙක් හෝ පුද්ගලයින් අඩු සංඛ්‍යාවක් මත සෘජු ප්‍රතිලාභයක් සිදුකරන කාර්යයන්*[6]
    - *ආන්තික, සෘජු හෝ විරල කාර්යයන්*[7]
    - *විභව්‍ය සහ විද්‍යාමාන නොවන අනාගත පොදු කාර්යය*[8]
    - *අභිමත පොදු කාර්යයන්*[9].
    - *දුරස්ථ අනාගතයෙහි දී පමණක් සැබෑ විය හැකි කාර්යයක්*[10].
  - <u>පොදු කාර්යය යනු මොනවාද</u>**?**

    *පොදු යහපත ප්‍රවර්ධනය කරනු ලබන කාර්යයන්,*[11] *'ප්‍රජාවෙහි පොදු යහපත'*[12] *'සමස්තයක් වශයෙන් මහජන උපයෝගීතාවය සහ ප්‍රජාව*[13] *බලපෑමට ලක්වන දේශීය ප්‍රජාවට 'ප්‍රමාණවත් ලෙස සෘජු ස්වභාවයක' ප්‍රතිලාභයක්*[14] *පොදු කාර්යය නිශ්චිත, සත්‍ය සහ විද්‍යාමාන විය යුතුය*[15]

---

[1] මානෙල් ප්‍රනාන්දු එදිරිව ජයරත්න[2000] 1 SriLR 126

[2] හොරණ ප්ලාන්ටේෂන් ලිමිටඩ් එදිරිව. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, ශ්‍රේ..අභි. අංක /2009 9.

[3] සිරිසේන සහ අනිකුත් අය එදිරිව ගරු එච්. එස්. ආර්.බී. කොබ්බෑකඩුව, කෘෂිකර්ම සහ ඉඩම් අමාත්‍ය (1974) 80 NLR 1.

[4] ද සිල්වා එදිරිව අතුකෝරාල, ඉඩම්, වාරිමාර්ග සහ මහවැලි සංවර්ධන සහ අනෙකුත් අමාත්‍ය [1993] 1 SriLR 283.

[5] හොරණ ප්ලාන්ටේෂන් ලිමිටඩ් එදිරිව. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, ශ්‍රේ.අභි. අංක /2009

[6] සුගතපාල මෙන්දිස් එදිරිව කුමාරතුංග මිය ශ්‍රේ. FR 352/07(02/08/2009) 23.

[7] සුගතපාල මෙන්දිස් එදිරිව කුමාරතුංග මිය ශ්‍රේ. FR 352/07(02/08/2009) 23.

[8] ඩීඑෆ්ජ් කපුගීකියන එදිරිව ජේබී තෙන්නකෝන්, ශ්‍රේ. අභි. අංක. 161/2010 (18.11.2013) 5.

[9] ඩීඑෆ්ජ් කපුගීකියන එදිරිව ජේබී තෙන්නකෝන් ශ්‍රේ. අභි. අංක 161/2010 (18.11.2013) 5 at 13

[10] ඩීඑෆ්ජ් කපුගීකියන එදිරිව ජේබී තෙන්නකෝන් ශ්‍රේ. අභි. අංක 161/2010 (18.11.2013) 5 at 13

[11] ද සිල්වා එදිරිව අතුකෝරාල, ඉඩම්, වාරිමාර්ග සහ මහවැලි සංවර්ධන සහ අනෙකුත් අමාත්‍ය [1993] 1 SriLR 283

[12] සුගතපාල මෙන්දිස් එදිරිව කුමාරතුංග මිය ශ්‍රේ. FR 352/07(02/08/2009) 23.

[13] *Ibid* 23-24.

[14] *Ibid* 22.

[15] *Ibid* 13.

*ඔබේ ඉඩම අත්පත්කර ගැනීම*

*ප්‍රාදේශීය සභාවකට හෝ නාගරික සංවර්ධන අධිකාරයට හෝ මහ නගර සභාවකට හෝ නගර සභාවකට පවා පෞද්ගලික ඉඩමක් අත්පත් කර ගැනීම පිණිස පොදු කාර්යයක් තිබිය යුතුය;*

*ජනාධිපතිවරයාගේ ප්‍රකාශයක් යටතේ වහා සිදුකළ යුතු පදනම මත නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඔබේ ඉඩම අත්පත් කරගනු ලැබුව ද, එවැනි අත්පත්කර ගැනීමක පොදු කාර්යය අභියෝගයට ලක් කිරීම සඳහා ඔබට තවමත් අයිතිය ඇත.;*

*එම පොදු කාර්යය කුමක්දැ යි දැන ගැනීමට ඔබට අයිතිය ඇත.;*

*මාර්ගයක් පුළුල් කිරීමට හෝ ඇති කිරීමට ප්‍රාදේශීය සභාවක් විසින් ඉඩමක් අත්පත් කර ගත්විට, අවස්ථා තුනක දී වෙන් වෙන් නිවේදනයන් තුනක් පළ කිරීමට එයට සිදු වේ. එය සිදු නොකරන ලද අවස්ථාවක අභියාචනාධිකරණය හෝ පළාත්බද මහාධිකරණයක් ඉදිරියේ ක්‍රියාවලිය අමභියෝගයට ලක් කිරීමට ඔබට අයිතිය ඇත.;*

*ඔබගේ පෞද්ගලික ඉඩම හරහා යෝජිත මාර්ගයක් සඳහා විරුද්ධ වීමට ඔබට අයිතිය ඇත.;*

*ඔබේ ඉඩම පොදුකාර්යයක් සඳහා අවශ්‍ය වන්නේ යැයි ප්‍රාදේශීය සභාවක් විසින් ගෙන ඇති තීරණය සාධාරණීකරණය කළ නොහැකි නම්, ඔබට එම තීරණය අභියාචනාධිකරණය හෝ පළාත්බද මහාධිකරණයක් ඉදිරියේ අභියෝගයට ලක් කිරීමට හැකිය;*

## 3. පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීමේ දී පළාත්පාලන අධිකාරීන් අනුගමය කළයුතු පියවර මොනවාද?

### i. <u>ප්‍රාදේශීය සභා</u>

ප්‍රාදේශීය සභා පනත සහ ඒ යටතේ නිකුත්කරන ලද නියෝගයන් මඟින් ප්‍රාදේශීය සභා පාලනය වීම සිදුවේ.

**අ. ප්‍රාදේශීය සභාවකට ඉඩමක් මැනීම කළ හැකි ද ?**

සභාවේ සභාපතිවරයාට යම් '<u>දේශීය පොදු කාර්යයකට</u>' අවශ්‍ය පුද්ගලික ඉඩම්, ගොඩනැගිලි හෝ පරිශ්‍ර මැනීම සහ පරීක්ෂා කිරීම සඳහා තම නිලධාරීන්ව යොමු කළ හැකිය. ඉඩම සඳහා යම් හානියක් සිදු කළේ නම් එකී හානිය වෙනුවෙන් වන්දි ගෙවීමට රජය බැඳී සිටී. මිනින්දෝරුවන්ට ඉඩම කැණීම සහ සෑරීම, සීමාවන් සළකුණු කිරීම මාර්ගයෙහි ඇති ඕනෑම භෝගයක් හෝ කැලෑ හෙළි කිරීම සහ ඉඩම පොදුකාර්යය සඳහා යොදා ගත යුතු ද යන්න තීරණය කිරීම පිණිස අවශ්‍ය වෙනත් ඕනෑම ක්‍රියාවක් සිදු කිරීමට හැකිය. පදිංචි ගොඩනැගිල්ලකට හෝ සංවෘත ප්‍රදේශයකට ඇතුළු වීම පිණිස, නිලධාරියා පදිංචිකරුගෙන් හෝ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන් අවසර ලබා ගත යුතුය.(20(3) වගන්තිය)

**අ. ප්‍රාදේශීය සභාවකට පෞද්ගලික ඉඩමක් අත්පත්කර ගත හැකිද?**

යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් <u>ප්‍රාදේශීය සභාවේ කාර්යයක් සඳහා අවශ්‍ය කරනු ලබන විටක, එය පොදු කාර්යයක් ලෙස සැලකේ</u>. එවැනි පොදු කාර්යයක් සඳහා අවශ්‍ය කරනු ලබන ඉඩම් සහ ගොඩනැගිලි ඉඩම් අත්පත්කර ගැනීමේ පනතෙහි (128 වගන්තිය, ප්‍රාදේශීය සභා පනත) විධිවිධාන යටතේ රජය මඟින් ප්‍රාදේශීය සභාව සඳහා අත්පත් කරගත හැකිය. එබැවින් එවැනි අත්පත් කර ගැනීමක් ඉඩම් අත්පත් කරගැනීමේ පනතෙහි දක්වා ඇති ක්‍රියා පරිපාටිය අනුගමනය කිරීමෙන් පසුව සිදු කළ යුතු අතර, ප්‍රාදේශීය සභාව වෙනුවෙන් මධ්‍යම රජය විසින් එය සිදුකළ යුතුය.

ප්‍රාදේශීය සභා පනතෙහි 28 වන වගන්තිය මඟින් පැවසෙන්නේ "යම් ප්‍රසිද්ධ මාර්ගයක් වෙනත් අතකට හැරවීම, වෙනතකට යොමුකිරීම, පුළුල් කිරීම, විවෘත කිරීම, විශාල කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා පුද්ගලික ඉඩමක් පවරා ගැනීමට ප්‍රාදේශීය සභාවට අවශ්‍ය වූ විට හෝ, (1) උප වගන්තිය යටතේ වන්දි මුදල් ගෙවීමට යම් ඉඩමක හිමිකරුවෙකු සමඟ එකඟ වීමට ප්‍රාදේශීය

සභාවට නොහැකි වූ විට, හෝ එවැනි හිමිකරුවෙකු සොයා ගත නොහැකි වූ විට, හෝ යම් ඉඩමක හිමිකරු සමඟ ගිවිසුමකට එළඹීම යෝග්‍ය නොවන බවට ප්‍රාදේශීය සභාව විසින් සලකනු ලබන විටක, පනතෙහි 128 වන වගන්තිය යටතේ අත්පත් කර ගැනීම සිදු කළ හැකි" බවයි. එවැනි අවස්ථාවක දී 128 වන වගන්තිය යටතේ එයට ඉඩම් අත්පත් කරගැනීම සිදු කළ හැකිය. එබැවින් මධ්‍යම රජය මඟින් ප්‍රාදේශීය සභාවක් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම 28 වන වගන්තියෙහි දක්වා ඇති කාර්යයන් එනම්; යම් ප්‍රසිද්ධ මාර්ගයක් හැරවීම, වෙනතකට යොමුකිරීම, පුළුල් කිරීම, විවෘත කිරීම, විශාල කිරීම හෝ වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා යන්න විවාදයට තුඩු දුන් කරුණකි.

**ඇ. ප්‍රාදේශීය සභා පාරවල් සහ මාවත් ලෙස මාර්ග ප්‍රාදේශීය සභා සතුවී ඇත්තේ කෙසේද?**

ප්‍රාදේශීය සභා පනත පැනවීමත් සමඟම, ප්‍රදේශයේ සියළුම ප්‍රසිද්ධ මාර්ග ප්‍රාදේශීය සභාව සතු වේ යැයි සැලකේ. (වෙනත් ප්‍රඥප්තියක් මඟින් විශේෂයෙන් පවරන ලද ඒවා සහ ප්‍රධාන මාර්ග හැර)

පනතට අනුව, ප්‍රාදේශීය සභාවකට එහි ආරම්භයේ සිට වසර 3ක් ඇතුළත ප්‍රාදේශීය සභා පාරවල් වල සීමාවන් සළකුණු කිරීමට සිදු වේ. වසර තුනක් ඇතුළත ඔවුන් එසේ සළකුණු නොකරන්නේ නම්, ප්‍රාදේශීය සභා පාරවල් ලෙස මාවත් සළකුණු කිරීම පිණිස ඔවුන් අමාත්‍යවරයාගෙන් අවසර ලබාගත යුතුය (විශේෂ අවස්ථා සඳහා).

එවැනි පාරවල් ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කළ යුතු අතර, එවැනි මාවත් සහ පාරවල් වල පිඹුරක් ප්‍රාදේශීය සභාව විසින් සැකසිය යුතුය. ප්‍රාදේශීය සභ පාරවල් සළකුණු කිරීමේ දී, ප්‍රාදේශීය සභාව විසින් නිවේදන මාලාවක් පළ කල යුතු අතර, පනත හා අනුකූල වන ක්‍රියාදාමයක් අනුගමනය කළ යුතුය.

<u>නිවේදනයන්</u>:- නිවේදනය පෞද්ගලිකවම පුද්ගලයාට ලබාදීම (එනම්, හිමිකරුට හෝ පදිංචිකරුට) හෝ එය ඔහුගේ නිවසෙහි කිසියම් සාමාජිකයෙකුට ලබාදීම, හෝ ඔහුගේ පදිංචි ස්ථානයේ කිසියම් පැහැදිලිව දිස්වන ස්ථානයක ඇලවීම සිදුකළ යුතුයි. නිවේදනය "නියමිත ආකෘතියක" විය යුතුය.

<u>පළමු නිවේදනය</u>:- පළමු නිවේදනය පලකළ යුත්තේ මාර්ග සහ මාවත් වල ලැයිස්තුවක් විදහා දක්වමිනි. (24(1) වගන්තිය, ප්‍රාදේශීය සභා පනත).

පළමු නිවේදනය පළකිරීමෙන් පසු, බලපෑමට ලක්වූ දේපළෙහි හිමිකරුවන් වන පුද්ගලයින්ට ගැලපෙන (දිස්ත්‍රික් අධිකරණය) අධිකරණයක නඩුවක් ගොනුකර ඉඩම සඳහා තම නීත්‍යානුකූල අයිතිය තහවුරු කළ හැකිය. එසේ කිරීමට අපොහොසත්වීම හේතුවෙන් ප්‍රාදේශීය සභාවට ඉදිරි පියවර, එනම් ඉඩම ප්‍රාදේශීය සභා පාරක් හෝ මාවතක් බවට සලකමින් දෙවන නිවේදනය නිකුත් කිරීම සිදු කළ හැකිය.

<u>දෙවන නිවේදනය</u>:- ඉන් අනතුරුව අධිකරණ නියෝග යටතේ සිදුකළ යුතු යම් යම් වෙනස්කම් අන්තර්ගත කරමින්, එකී දිනයේ සිට මාස 3කට පසුව සහ මාස 6කට පෙර දෙවන නිවේදනය පළකල යුතුය. එවැනි පාරක්/මාවතක් සම්බන්ධ අවසන් තීරණය ලැබෙන තෙක් සිටින අවස්ථාවක, එය දෙවන නිවේදනයේ ඇතුළත් නොකළ යුතුය.

*වන්දි ලබාදීම*

*ඔබේ පෞද්ගලික ඉඩම පොදු කාර්යයක් සඳහා අත්පත් කරගනු ලබන්නේ නම් ඔබට වන්දි ලබාගැනීමට හිමිකම ඇත;*

*වන්දි ලබා ගැනීම මුදලින්, හෝ ඔබට විකල්ප ඉඩමක්/ පෙර පැවති පාරෙහි කොටසක් ලබාදීම මඟින් සිදුකළ හැකිය ;*

*වන්දි වශයෙන් ඔබට ලබාදී ඇති කිසියම් ඉඩමක් සම්බන්ධ නිරපේක්ෂ අයිතිය ඔබ සතුය;*

<u>තෙවන නිවේදනය</u>:- විසඳීමට තිබෙන නඩුවල අවසන් තීරණය නිකුත් කිරීමෙන් පසුව තුන්වන නිවේදනය පළ කරන අතර, පාරවල් සහ මාර්ගවල අතිරේක ලැයිස්තුවක් එහි අඩංගු වේ. මෙය පළ කිරීමට පෙර, සළකුණු කිරීම් වල යම් වෙනස්කමක් පිඹුරෙහි මෙන්ම අතිරේක ලැයිස්තුවෙහි ද සිදුකළ යුතුය.

දෙවන සහ තෙවන නිවේදනයන් පළකිරීමෙන් පසු, එම නිවේදනයන්හි දැක්වෙන පාරවල් සහ මාවත් ප්‍රාදේශීය සභා පාරවල් ලෙස සලකනු ලබයි. ඒවා ප්‍රාදේශීය සභා පාරවල් සහ මාවත් ලෙස සැලකූ විට, එකී පාරවල් සම්බන්ධයෙන් කිසිවෙකුට කාලාවරෝධී අයිතිය හෝ හිමිකාරිත්වය ඉල්ලා සිටිය නොහැක (25 වගන්තිය, ප්‍රාදේශීය සභා පනත).

ප්‍රාදේශීය සභාවක් විසින් මෙම ක්‍රියාවලිය අනුගමනය නොකරන්නේ නම්, තම ඉඩම ප්‍රාදේශීය සභා පාරක් ලෙස සළකුණු කර ඇති ඉඩමෙහි හිමිකරුට, එවැනි අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියක් ප්‍රාදේශීය සභාවක් එහි ව්‍යවස්ථාපිත බලය ඉක්මවා ක්‍රියාකිරීමට එරෙහිව රිට් අධිකරණ බලයක් යටතේ අභියෝගයට ලක්කළ හැකිය.

ඇ. **පාරවල් වෙනත් අතකට හැරවීම් සහ පුළුල් කිරීම සඳහා ප්‍රාදේශීය සභා විසින් ඉඩම් අත්පත් කර ගන්නේ කෙසේද?** (28 වගන්තිය)

පාරක් වෙනත් අතකට හැරවීම හෝ පුළුල් කිරීම සඳහා ඉඩමක් අත්පත්කර ගැනීමට ප්‍රාදේශීය සභාවට අවශ්‍ය වූ විට, එකී ඉඩම සඳහා වන්දි ගෙවීමට ඉඩම් හිමියා සමඟ ගිවිසුමකට එළඹීමට හෝ හුවමාරුවක් වශයෙන් වෙනත් ඉඩමක් ලබා දීමට හෝ එම කාර්යයන් දෙකම සිදුකිරීමට එයට හැකියාව ඇත (28 වගන්තිය, ප්‍රාදේශීය සභා පනත). ගිවිසුමකට එළඹීමට නොහැකි නම්, එවිට ප්‍රාදේශීය සභාවට ඉඩම හිමිකර ගත හැකි අතර, පනතෙහි 128 වන වගන්තිය යටතේ වන්දි ගෙවිය හැක. මෙම වගන්තිය යටතේ, එවැනි ඉඩමක්, සහ එම ඉඩමෙහි පිහිටි ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක්, පිවිසුම් ස්ථානයක්, වැටක් හෝ ගසක් වෙනුවෙන් වන්දි ගෙවීම සිදුකළ හැකිය.

**ඉ. පවත්නා වන්දි ලබාගැනීම් ක්‍රම මොනවාද?**

1. පැවති මාර්ගයේ කොටසක් හිමිකර ගැනීමට අයිතිකරුට ඉඩ ලබා දීම
2. වෙනත් ඉඩමක් ප්‍රදානය කිරීම
3. මූල්‍යමය වන්දි

4. එවැනි ක්‍රම 2ක් හෝ වැඩි ගනනක්

**ඊ. ඉහතකී 1 සහ 2ට අනුව වන්දිමුදල් හිමිකරගන්නා පුද්ගලයින්ගේ අයිතිවාසිකම් මොනවාද?**

- ඒ සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරිවරයාගේ/ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ සහතිකය
  -සහ-
- එහි බිම් සමීක්ෂණයක්

එවැනි බිමක් හෝ ඉඩමක් සම්බන්ධ එම පුද්ගලයාගේ අයිතිය පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂයක් වන්නේය.

**උ. සිදුවන්නේ කුමක්ද කුමන අවස්ථාවේ ද?**

- ප්‍රාදේශීය සභාව සහ අයිතිකරු අතර වන්දි මුදල් පිළිබඳ එකඟතාවයකට පැමිණීමට නොහැකි නම්,
- හෝ හිමිකරු සොයාගත නොහැකි අවස්ථාවක,
- හෝ කිසියම් ඉඩමක අයිතිකරු සමඟ යම්කිසි ගිවිසුමකට එළඹීම ඔවුනට උචිත නොවන්නේ යැයි සභාවට හැඟෙන අවස්ථාවක,

ඉඩම් අත්පත් කර ගැනීමේ පනතෙහි (එනම් 128 වන වගන්තිය යටතේ අත්පත් කර ගැනීම, ප්‍රාදේශීය සභා පනත) නිශ්චිතව දක්වා ඇති ආකාරයට, අයිතිකරු සඳහා වන්දි ලබා දීම සිදුකර ගනිමින් ඉඩමෙහි හිමිකම ලබා ගැනීම පිණිස ක්‍රියාමාර්ග ගත හැකිය.

**ඌ. ඉදිකිරීමේ කාර්යයන් සඳහා නව මාවත් සම්බන්ධ කිරීම පිණිස ඉඩම් ලබාගැනීමේදී ප්‍රාදේශීය සභා සතුව ඇති බලතල මොනවාද?**

කිසියම් නව වීදියක් හෝ ප්‍රසිද්ධ මාර්ගයක් ඉදිකිරීමේ දී (එසේත් නොමැති නම් යම් වීදියක්/ප්‍රසිද්ධ පාරක් වැඩි දියුණු කිරීමේ දී), ප්‍රාදේශීය සභාවක් විසින් නව වීදිය ඉදිකිරීම සඳහා ගනු ලැබූ ඉඩමට අමතරව, එකී වීදිය හෝ ප්‍රසිද්ධ පාර තැනීමට/පෙළ ගැස්සවීමට අවශ්‍ය හෝ අවශ්‍ය විය හැකි ඉඩම් මිලදී ගැනීමට ද හැකියාව ඇත. ප්‍රාදේශීය සභාව විසින් මිලදී ගනු ලබන මෙම ඉඩම් 18 වන වගන්තියේ දක්වා ඇති කොන්දේසි වලට යටත්ව මෙන්ම ප්‍රාදේශීය සභාව විසින් යෝග්‍ය බවට සිතිය හැකි යෝජිත නිවාස/ගොඩනැගිලිව පන්තිය සහ විස්තරය හා අනුකූලව විකිණීම/බදුදීම සිදුකළ හැකිය.

**එ. ප්‍රාදේශීය සභා පාලනය යටතේ පවතින මාවත්වල වැවෙන හෝ උඩින් එල්ලා වැටෙන ගස්, පඳුරු/ගොමු, පත්‍ර/අතු සහ ශාඛාවල මුල් ආදියට අදාළව ප්‍රාදේශීය සභාව සතු බලතල මොනවාද?**

ප්‍රාදේශීය සභාවෙහි නිසි නිලධාරීන්ට එවන් දේ කැපීමට, ඉවත් කිරීමට සහ ඕනෑම යාබද/අසල්වාසී ඉඩමක ස්ථාපනය කිරීමට හැකියාව ඇත. මෙම කාර්යය සඳහා අවශ්‍ය පුද්ගලයින්, සතුන් සහ උපකරණ රැගෙන ඔවුනට පෞද්ගලික ඉඩමට ඇතුළු විය හැකි අතර; ගස්, පඳුරු, ආදිය කැපීමට, අතුපැස්සීමට හෝ ඉවත් කිරීමට අවශ්‍ය ඕනෑම ක්‍රියා මාර්ගයක් ගත හැකිය. කෙසේවෙතත්, එවැනි නිලධාරීන් විසින් පෞද්ගලික ඉඩම් මත ස්ථාපනය කරන ලද ගස්, පඳුරු, ආදිය එම නිලධාරීන්

විසින්ම සාධාරණ කාල පරිච්ඡේදයක් තුළ පිරිසිදු කිරීම සිදුකළ යුතුය (43 වගන්තිය, ප්‍රාදේශීය සභා පනත).

**ඒ. වැටවල් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව සතු බලතල මොනවාද`?**

අවශ්‍ය කරනු ලබන බවට තමාට හැඟී යන්නේ නම්, ප්‍රාදේශීය සභා පාලනය යටතේ පවතින වීදිවල පසෙක වැටවල්, බඩවැටි, කාණු, අගල් හෝ ඉවුරු තැනීමට/ඉදිකිරීමට ප්‍රාදේශීය සභාවේ නිසි නිලධාරීන්ට හැකියාව ඇත. ඉන්පසුව, එවැනි වැටවල්, බඩවැටි ආදියට යාබදව සිටින අයිතිකරුවන්ට හෝ පදිංචිකරුවන්ට ඒවා පිළිසකර කිරීමට සහ  මනා තත්ත්වයෙන් පවත්වා ගැනීමේ වගකීම පැවරේ (44 වගන්තිය, ප්‍රාදේශීය සභා පනත).

**ඔ. ස්වකීය බලාධිකාරිය යටතේ මාවත් දිගේ ඇති කාණු, පීලි, අගල් සහ දියපාරවල් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව සතු බලතල මොනවාද?**

එවැනි අගල්, කාණු ආදිය සෑදීමට, ආරක්ෂා කිරීමට, පිරිසිදුකිරීමට සහ විවෘතව තබාගැනීමට ප්‍රාදේශීය සභාවේ නිසි නිලධාරීන්ට බලය ඇත. තවද, යම් වීදියක් හෝ අපේක්ෂිත වීදියක් හෝ එවැනි වීදියකට යාබදව පිහිටි යම් ඉඩමක්/භූමියක් ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම, වැඩි දියුණු කිරීම, අළුත්වැඩියා කිරීම හෝ ඉදිකිරීම සඳහා අවශ්‍ය යැයි සැලකෙන එවැනි කාණු, ජලමාර්ග, පටුමාර්ග, උමං, පැලැටි හෝ පාලම් තැනීමට සහ ඉදිකිරීමට ඔවුනට බලය ඇත (45 වගන්තිය, ප්‍රාදේශීය සභා පනත).

<u>ii.මහ නගර සභා සහ නගර සභා</u>

**අ. මහනගර සභා සහ නගර සභා සතු සමාන බලතල මොනවාද?**

ප්‍රාදේශීය සභාවලට මෙන්ම මහනගර සභා සහ නගර සභාවලටද ඉඩම් මැනීම සිදුකළ හැකිය. ප්‍රාදේශීය සභා පනතෙහි දක්වා ඇති එම කොන්දේසිවලට ම යටත්ව වීදි වැඩි දියුණු කිරීම පිණිස ඔවුනට ද  ප්‍රාදේශීය සභා ආකාරයෙන්ම ඉඩම් අත්පත් කරගත හැක. ස්වකීය අධිකාරිය යටතේ වීදි නඩත්තු කිරීමට අදාළව ප්‍රාදේශීය සභාවලට මෙන්ම සමාන බලතල ඔවුනට ද තිබේ.

**ආ. ප්‍රාදේශීය සභා මත පැවරී ඇති බලය ඉක්මවා යන, මහනගර සභා සහ නගර සභා සතු බලතල මොනවාද ?**

අත්පත්කර ගනු ලබන්නේ <u>කුමන කාර්යය සඳහා ද යන්න අනාවරණය නොකර</u> සාමාන්‍ය පොදු කාර්යයක් සඳහා ඉඩම් සහ ගොඩනැගිලි අත්පත්කර ගත හැකි බව මහනගර සභා ආඥාපනතෙහි 44 වගන්තිය ද නගර සභා පනතෙහි 41 වන වගන්තිය ද සඳහන් කරයි.

<u>සටහන්</u>

නීතිය හා සමාජ භාරය 1982 දී ශ්‍රී ලංකාවේ, කොළඹ ස්ථාපනය කරන ලද ලාභ ඉපයීම පරමාර්ථ කර නොගත් සංවිධානයකි. එය සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්; සමාජ, ආර්ථික හා සංස්කෘතික අයිතිවාසිකම් සහ ගැටුම්කාරී තත්ත්වය තුළ පවතින මානව හිමිකම් යන වැඩ සටහන් තුන පෙරදැරි කරගත් ප්‍රලේඛනයන්, පර්යේෂණ සහ උපදේශාත්මක වැඩ සටහන් හා සම්බන්ධව ක්‍රියා කරනු ලබයි. 'නීතිය හා සමාජ භාර මාසික සඟරාව' හා 'ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය' යන ප්‍රකාශනයන් මෙහි නියත ප්‍රකාශනයන්ට අයත්වේ. නීතිය හා සමාජ භාරය මානව හිමිකම් හා සංවර්ධනය සඳහා ආසියානුවන් (FORUM-ASIA) සහ මානව හිමිකම් සඳහා ආසියානුවන් (SAHR) යන කලාපීය ජාල වලද සාමාජිකයෙකි.


දුරකථන: +94112691228, +94112684845, +94112684853

ලිපිනය : 3, කින්සි ටෙරසය, කොළඹ 8. ශ්‍රී ලංකාව.

ඊ මේල් : lst.escrprogram@gmail.com

වෙබ් අඩවිය :www.lawandsocietytrust.org

ෆැක්ස් : +94112686843